# රබර් ඉඩම් හිමියන් රාශියකට බලපාන පොදු ප්‍රශ්න කීපයකට පිළිතුරු

(මින් ඉදිරියට පලවන 'රබර් පුවත්' සඟරාවේ මෙම තීරය මගින් රබර් ඉඩම් හිමියන්ට බලපාන පොදු ප්‍රශ්නවලට උපදේශාත්මක පිළිතුරු සැපයීමට බලාපොරොත්තුවෙමු. ඔබේ ප්‍රශ්නයත් පහත සඳහන් ලිපිනයට යොමුකරන්න.)

'රබර් පුවත් ප්‍රශ්න කවය',
ප්‍රධාන නිලධාරි,
උපදේශක සේවා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය,
තෙලවල පාර, රත්මලාන, ගල්කිස්ස.

1. ප්‍රශ්නය : (1965 සිටවූ) ආර්ආර්අයිසී. 52 වර්ගය සුළඟට ඔරොත්තු දෙන කොළ නිවාඩුවක් නැති, දිනපතා කැපුවත් කිරිවල ඝනකම අඩු නොවන ඉතා හොඳ රබර් වර්ගයක්ව තිබියදීත් එම වර්ගය වැවීම නිර්දේශ නොකර වෙනත් වර්ග නිර්දේශ කරන්නේ ඇයි?

පිළිතුර: ආර්ආර්අයිසී 52 වර්ගයේ අස්වැන්න මුලදී අඩුනිසා සමහර රබර් ඉඩම් හිමියන් මෙම ක්ලෝනය කෙරෙහි වැඩි කැමැත්තක් දක්වා නැත. වැඩි අස්වැන්නක් ලබාගත හැකි රබර් වර්ග සොයා බලා ඒවා නිර්දේශ කරන ලෙස බොහෝ දෙනා ඉල්ලා සිටි බැවින් ආර්ආර්අයිසී. 52 වෙනුවට වෙනත් වර්ග නිර්දේශ කිරීමට සිදුවිය.

2. ප්‍රශ්නය: සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානවලට ගෙනෙන අමුකිරි වලට නියම බර නොලැබෙන්නේ ඇයි? සමහර සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානවල ඉතිරිය වශයෙන් ලොකු කොටසක් අඩුකෙරේ. මෙය නවතා දැමිය නොහැකිද?

පිළිතුර: දියරයක ඝනත්වය මැනීමට භාවිතාකරන උපකරණයකි මැට්‍රොලැක් (Metrolac) උපකරණය. රබර් කිරි සාමාන්‍යයෙන් උකු නිසා එම කිරිවල එය ක්‍රියා නොකරන බැවින් වතුර සමග මිශ්‍රකර මැනීම කරනු ලැබේ. සමහර විට මෙම මැනීමේ සුලු වෙනසක් තිබිය හැකිය. කලින් කලට කිරිවල උකුබව වෙනස්වන නිසා මෙම වෙනස සිදුවිය හැකිය. ඉතිරිය වශයෙන් ගණන් ගන්නේ මෙම වෙනස එකතුවූ විටය. එහෙත් එම ඉතිරිය සියලුම සාමාජිකයන් අතරේම බෙදීයන බැවින් එය ප්‍රශ්නයක් නොවනු ඇත. ඉතිරිය යනුවෙන් එක් එක් අය ගෙනෙන රබර් ප්‍රමාණය අනුව වෙනම ප්‍රමාණයක් අඩු කරන්නේ නැත.

3. ප්‍රශ්නය: කිරි පෙරන දැල් සහ තැටි ලබාගැනීම අපහසු බැවින් මේවා ලබාගැනීමට පහසුකම් සැලැස්විය නොහැකිද?

පිළිතුර: මෙම දැල් බෙදදීමට කටයුතු යොදා ඇත. දැල් ඒවායේ වටිනාකමෙන් සැහෙන අඩු මිළකට දීමට (අඟල් 6×6 ප්‍රමාණයේ කැබැල්ලක් රු. 3.00කට) පිළියෙල කර ඇත. මෙම මොනල් ලෝහ දැල් උවමනා කුඩා ඉඩම් හිමියන්ට පළාතේ රබර් උපදේශක මහතා හමුවී දැල් කැබැල්ලක් හෝ දෙකක් ලබා ගැනීමට පුළුවන. එහෙත් සෑම කුඩා ඉඩම් හිමියෙකුටම තැටි ලබාදීම කළ නොහැකි බැවින් සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානවලට පමණක් මේවා සපයනු ලැබේ.